**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2022.02.10 වන දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව.**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මාසික මහා සභා රැස්වීම 2022 පෙබරවාරි මස 10 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

| | | | |
|---|---|---|---|
| 02. | ගරු උපසභාපති | - | ඩී.වී.උපාලි මැතිතුමා. |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා. |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා. |
| 05. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා. |
| 06. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා. |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.වී.ආරියරත්න මැතිතුමා. |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය. |
| 09. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.එස්.දීප්ති ධර්ම ශ්‍රී මැතිතුමා. |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.එම්.උපාලි ජයරත්න මැතිතුමා. |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.බිමල්ක ප්‍රමෝද්‍යා මැතිතුමා. |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.වී.අජිත් නිශාන්ත මැතිතුමා. |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.එම්.හේමන්ත පෙරේරා මැතිතුමා. |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.ඉන්දික මැතිතුමා. |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | පී.ජී.හිරන්ති චතුරංගනී ගමගේ මැතිතුමිය. |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය. |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා. |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එල්.සුමිත් කුමාර මැතිතුමා. |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමා. |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඊ.චන්දිම ධර්මප්‍රිය ඇලපාත මැතිතුමා. |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා. |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා. |
| 23. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා. |
| 24. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.පියසේන මැතිතුමා. |
| 25. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.චමින්ද ගුණරත්න මැතිතුමා. |
| 26. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සුරවීර මැතිතුමා. |
| 27. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ටී.රිද්මා අනුරුද්ධිකා ධර්මවර්ධන මැතිතුමිය. |
| 28. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය. |
| 29. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා. |
| 30. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සෙල්වනායගම් රගවන් මැතිතුමා. |
| 31. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ඩී.පුෂ්පලතා වැලිකල මැතිතුමිය. |
| 32. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ටී.මෝහන්දාස් මැතිතුමිය. |
| 33. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා. |
| 34. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.ඉන්දික කුමාර දිසානායක මැතිතුමා. |
| 35. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා. |
| 36. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එල්.එස්.දයාල් චමින්ද කුමාර මැතිතුමා. |
| 37. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |

පැමිණ සිටි සියලු දෙනාම ආගම සිහි කර , රණවිරුවන් සිහිකිරීමෙන් පසුව ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපතිතුමා , ගරු විපක්ෂනායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද, ලේකම්තුමා හා නිලධාරීතුමිය ද පිළිගැනීමෙන් අනතුරුව සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**01. පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම. ( 2022.01.13)**

2022.01.13 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා සංශෝධන ඇතොත් ඉදිරිපත් කිරීමටත් , සංශෝධන නොමැති නම් එම වාර්තාව සභා සම්මත කිරීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ඒ අනුව 2022.01.13 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු උප සභාපති ඩී.වී.උපාලි මැතිතුමන් විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමන් විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදනය.**

1. පාසල් වල පිරිසිදු පානීය ජලය හා වැසිකිළි පහසුකම් සපුරාලීම පළාත් පාලන ආයතන වල දායකත්වය ලබා ගැනීම සම්බන්ධව පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අංක ACLG 04/03/05 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කිරීම.

අදහස් දක්වමින් ගරු උප සභාපති ඩී.වී.උපාලි මැතිතුමා පවසා සිටියේ කොරෝනා වසංගතයත් සමඟ ප්‍රාදේශීය සභාවට ආදායම අඩු වූ බවත් , පාසල් වලට ජලය හා වැසිකිළි පහසුකම් ලබා දීමට හැකි නම් එය වටිනා බැවින් ඒ සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමාට දන්වා යැවීම සුදුසු බව ය.

ගරු විපක්ෂනායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ ලෝක බැංකුවේ සනීපාරක්ෂක ව්‍යාපෘති පවතින බවත් , එමඟින් පාතකඩ කණිෂ්ට අංශයට ලක්ෂ 30කටත් වඩා මුදල් වියදම් කර වැසිකිළි හා පානීය ජලය ලබා දුන් බවත් , එම ව්‍යාපෘතියෙන් ඉල්ලීමක් කළහොත් උදව් ලබා ගැනීමට හැකි බවත් , එනිසා ඒ සම්බන්ධව අවධානය යොමු කළ යුතු බවත් ය.

අවසාන වශයෙන් ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ මේ සඳහා සභා අරමුදලින් විශාල බරක් දැරීමට අපහසු බවත් , මක් නිසා ද යත් මෙම වර්ෂයේ අයවැය යෝජනා වල දි ලක්ෂ 3ක මුදලක් පාසල් , පන්සල් සඳහා වෙන් කිරීමට තිබූ බවත් , ග්‍රාමීය කමිටු වලදි එම මුදල් වෙන් කර ඇති බවත් ය.

2. විදේශ නිවාඩු සඳහා අනුමැතිය ලබා දීමේ දී සිදු වන ප්‍රමාදයන් අවම කිරීම සඳහා 2022.01.01 දින සිට පිළිපදින ලෙස පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් එවා ඇති උපදෙස් සහිත ලිපිය සභාවට ඉදිරිපත් කිරීම.

**03. සභාව අමතා එවන සංදේශ, මහජන පෙත්සම්/පැමිණිලි සභාව ඉදිරියේ තැබීම.**

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත.**

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා.**

I. <u>ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ යෝජනා.</u>

**01.** 2021 වර්ෂය සඳහා සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයට අදාලව එම සමීක්ෂණ මණ්ඩලය විසින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

<u>තීරණ අංක 01</u>

2021 වර්ෂය සඳහා සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයට අදාලව එම සමීක්ෂණ මණ්ඩලය විසින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා සභා අනුමැතිය ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** 2021 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු වලට අදාලව පහත නම් සඳහන් කමිටු සාමාජිකයින්ගෙන් සමන්විත තක්සේරු කමිටුව , අපහරණ කමිටුව හා වෙන්දේසි කමිටුව පත් කිරීමට යෝජනා කරමි.

| <u>තක්සේරු කමිටුව</u> | <u>වෙන්දේසි කමිටුව</u> | <u>අපහරණ කමිටුව</u> |
|---|---|---|
| බුද්ධික ගයාන් ප්‍රේමරත්න මයා | බුද්ධික ගයාන් ප්‍රේමරත්න මයා | යූ.එම්.සී ද සිල්වා මිය |
| එච්.එල්.එන්.යක්දෙහිවත්ත මයා | බී.ඒ.ඒ.ඊ.ජයවර්ධන මිය | එච්.කේ.බරණිගේ මිය |
| ඩිපෝ ඉන්ජිනේරුතුමා | ඩී.පී.එස්.සංජීව මයා | ඩී.එල්.එන්.දීපානි මිය |
| යූ.ජී.ඩී.ඩබ්.උඩගෙදර මිය | වී.ආර්.දන්ගල්ල මිය | එච්.එම්.එස්.එන්.මිණිපුර මිය |
| බී.ඒ.ඒ.ඊ.ජයවර්ධන මිය | එච්.එච්.ඩී.එම්.ගුණසේකර මිය | ඩී.ජේ.අයි.කේ.ජයතුංග මෙන |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 02</u>**

2021 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු වලට අදාලව ඉහත නම් සඳහන් කමිටු සාමාජිකයින්ගෙන් සමන්විත තක්සේරු කමිටුව , අපහරණ කමිටුව හා වෙන්දේසි කමිටුව පත් කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** 2022-2026 ඒකාබද්ධ උපාය මාර්ගික සංවර්ධන සැලැස්ම අනුමත කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 03</u>**

2022-2026 ඒකාබද්ධ උපාය මාර්ගික සංවර්ධන සැලැස්ම අනුමත කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** එච්.එල්.ඒ. අමරසේන යන නමින් ඇති අක්කර බදු අංක 47 යටතේ කේ.ඩබ්. ගුණපාල යන නම හා වැලිහිඳවත්ත කොටසක් යනුවෙන් දේපල සංශෝධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු විපක්ෂනායකතුමා හා ගරු උපසභාපතිතුමා වැලිහිඳවත්ත යනු රජයේ වත්තක් ද යන්න විමසන ලදී.

ඊට අදාල ආදායම් පරීක්ෂකතුමිගේ වාර්තාව , ඉඩමෙහි ඔප්පුව , පිඹුර පත හා පෙළපත් සටහන ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

**<u>තීරණ අංක 04</u>**

ආදායම් පරීක්ෂකතුමිගේ වාර්තාව , ඉඩමෙහි ඔප්පුව , පිඹුර පත හා පෙළපත් සටහන සලකා බලා , අක්කර බදු ලේඛනයේ අංක 47 යටතේ එච්.එල්.ඒ. අමරසේන යන නමින් ඇති දේපල කේ.ඩබ්. ගුණපාල යන නම හා වැලිහිඳවත්ත කොටසක් යනුවෙන් දේපල සංශෝධනය කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** පැල්මඩුල්ල, පාතකඩ සහ මාරපන යන පුස්තකාල සඳහා රු.50,000.00 ක උපරිමයකට යටත්ව 2021 වර්ෂය සඳහා පොත් මිලදී ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 05</u>**

පැල්මඩුල්ල, පාතකඩ සහ මාරපන යන පුස්තකාල සඳහා රු.50,000.00 ක උපරිමයකට යටත්ව 2021 වර්ෂය සඳහා පොත් මිලදී ගැනීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.** පැල්මඩුල්ල මහජන පුස්තකාලය සඳහා ඉලෙක්ට්‍රොනික් පුස්තකාල පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය පරිගණක පහසුකම් , අන්තර්ජාල පහසුකම් ලබා දීමටත්, අන්තර්ජාල භාවිතය වෙනුවෙන් පැයකට රු.50.00 බැගින් අය කිරීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 06</u>**

පැල්මඩුල්ල මහජන පුස්තකාලය සඳහා ඉලෙක්ට්‍රොනික් පුස්තකාල පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය පරිගණක පහසුකම් , අන්තර්ජාල පහසුකම් ලබා දීමටත්, අන්තර්ජාල භාවිතය වෙනුවෙන් පැයකට රු.50.00 බැගින් අය කිරීමටත් ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**07.** 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සබරගමුව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් 2013-06-28 දිනැති අංක 1817 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ iv (අ) කොටසේ පලකරන ලද්දාවූ සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව මේ යෝජනාව ගැසට් පත්‍රයේ පලකරන දින සිට ක්‍රියාත්මක කිරීමට, වැලඳගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 07</u>**

1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සබරගමුව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් 2013-06-28 දිනැති අංක 1817 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ iv (අ) කොටසේ පලකරන ලද්දාවූ සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව මේ යෝජනාව ගැසට් පත්‍රයේ පලකරන දින සිට ක්‍රියාත්මක කිරීමට, වැලඳගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව කළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**08.** පූජ්‍ය කුප්පියාවත්තේ බෝධානන්ද හිමි විසින් පැල්මඩුල්ල නගරයේ පිහිටා ඇති හෝරා ස්ථම්භයේ නඩත්තු කටයුතු මිතුරු මිතුරෝ සංසදය වශයෙන් වාර්ෂිකව පවත්වා ගෙන යාමට අවසර ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර ඒ සම්බන්ධව තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 08</u>**

පූජ්‍ය කුප්පියාවත්තේ බෝධානන්ද හිමියන්ට පැල්මඩුල්ල නගරයේ පිහිටා ඇති හෝරා ස්ථම්භයේ නඩත්තු කටයුතු මිතුරු මිතුරෝ සංසදය වශයෙන් වාර්ෂිකව රු.10,000.00 ක මුදලකට යටත්ව , වාර්ෂිකව ගිවිසුම් ගත වෙමින්, වසර 5ක කාලයක් පවත්වා ගෙන යාමට අවසර ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**09.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ වත්මන් සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න වන මා හට භාවිතා කිරීම සඳහා ප්‍රාදේශීය සභාව මඟින් ලබා දී ඇති ජංගම දුරකථනය මේ වන විට භාවිතා කළ නොහැකි තත්වයට පත් වී ඇති බැවින් එම ජංගම දුරකථනය වෙනුවට නව ජංගම දුරකථනයක් ලබා ගැනීමට අවශ්‍ය අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 09**</u>

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ වත්මන් සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාට භාවිතා කිරීම සඳහා ප්‍රාදේශීය සභාව මඟින් ලබා දී ඇති ජංගම දුරකථනය මේ වන විට භාවිතා කළ නොහැකි තත්වයට පත් වී ඇති බැවින් මිල ගණන් කැඳවා , එම ජංගම දුරකථනය වෙනුවට නව ජංගම දුරකථනයක් ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**10.** පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයිති පහළ බෝපිටිය ග්‍රාම නිලධාරී වසමේ කළුගම්මුල්ල මාර්ගය (ඉහළ බෝපිටිය පාරෙන් හැරී ) අබලන් තත්වයේ පවතින බැවින් පිළිසකර කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 10**</u>

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයිති පහළ බෝපිටිය ග්‍රාම නිලධාරී වසමේ කළුගම්මුල්ල මාර්ගය (ඉහළ බෝපිටිය පාරෙන් හැරී ) අබලන් තත්වයේ පවතින බැවින් පිළිසකර කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**11.** නාරංගොඩ ජනපදය මාර්ගයේ දුෂ්කර ස්ථාන කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 11**</u>

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර, නාරංගොඩ ජනපදය මාර්ගයේ දුෂ්කර ස්ථාන කොන්ක්‍රීට් කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**12.** කහවත්ත, දකුණු පනාවැන්න, ර/ප්‍රඥාධීර විද්‍යාලයේ පානීය ජල ළිඳ අලුත්වැඩියාව සඳහා ද්‍රව්‍ය ලබා දීම සම්බන්ධ රු.140,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 12**</u>

කහවත්ත, දකුණු පනාවැන්න, ර/ප්‍රඥාධීර විද්‍යාලයේ පානීය ජල ළිඳ අලුත්වැඩියාව සඳහා ද්‍රව්‍ය ලබා දීම සම්බන්ධ රු.140,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**13.** කහවත්ත , නීලගම , බෝධියගම ඉහල කොටස සංවර්ධනය කළ මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 13**</u>

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර, කහවත්ත නීලගම බෝධියගම ඉහල කොටස සංවර්ධනය කළ මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**14.** කුට්ටාපිටිය මාර්ගයෙන් හැරී තලගහ වත්තට යන මාර්ගය ඉතා අබලන් තත්වයේ ඇති බැවින් එය කොන්ක්‍රිට් කර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

__තීරණ අංක 14__

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර, කුට්ටාපිටිය මාර්ගයෙන් හැරී තලගහ වත්තට යන මාර්ගය ඉතා අබලන් තත්වයේ ඇති බැවින් එය කොන්ක්‍රිට් කර සංවර්ධනය කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**15.** කුට්ටපිටිය ග්‍රාම නිලධාරී වසමේ මදුරප්පුලිකන්ද හෙට්ටියාදෙනිය මාර්ගය අලුතින් සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

__තීරණ අංක 15__

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර, කුට්ටපිටිය ග්‍රාම නිලධාරී වසමේ මදුරප්පුලිකන්ද හෙට්ටියාදෙනිය මාර්ගය අලුතින් සංවර්ධනය කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**16.** පහත නම් සඳහන් අඩු ආදායම්ලාභී අය හට වැසිකිළි ආධාර ලබා දීමට යෝජනා කරමි.

- ඒ.ජී.ගාමිණී ප්‍රේමතිලක , නො.06 , නාරංගොඩ , පැල්මඩුල්ල.
- කේ.එච්.විමලා ජයලත් , නො. 101 , ශ්‍රී ජයමිණිගම , ඉහළ හකමුව.
- එන්.පී.අශෝක ජයලත් , ඉඳුර කෙටේතැන්න , කහවත්ත.
- බී.එම්.සෝමාවතී , ඉහලවෙල්යාය , හොරගස්ඕවිට , කෙටේතැන්න , කහවත්ත.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ආර්ථික තත්වය යහපත් වුවහොත් මෙම ඉල්ලීම් ඉෂ්ට කළ හැකි බව ය.

__තීරණ අංක 16__

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර, ඉහත නම් සඳහන් අඩු ආදායම්ලාභී අය හට වැසිකිළි ආධාර ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**II.** __ගරු උප සභාපති ඩී.වී.උපාලි මැතිතුමාගේ යෝජනා.__

**01.** රිල්හේන ලහිරු මාවතේ රණවිරු මාවත කොන්ක්‍රීට් කර ඉතිරි වූ අඩි 50 කොටස කොන්ක්‍රීට් කර දෙන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

__තීරණ අංක 17__

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර, රිල්හේන ලහිරු මාවතේ රණවිරු මාවත කොන්ක්‍රීට් කර ඉතිරි වූ අඩි 50 කොටස කොන්ක්‍රීට් කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**02.** රිල්හේන සමඟි මාවතේ 2 වන පටුමඟ ආරම්භක ස්ථානය අඩි 50 පමණ කොන්ක්‍රීට් කර දෙන ලෙස මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>තීරණ අංක 18</u>

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර, රිල්හේන සමඟි මාවතේ 2 වන පටුමඟ ආරම්භක ස්ථානය අඩි 50 පමණ කොන්ක්‍රීට් කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** ගිවිසුම්ගත කර වැඩ ඇරඹීමට ගොස් නැවතී තිබෙන රිල්හේන කනත්ත වත්ත මාර්ගය කඩිනමින් සකසා දෙන ලෙස මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙම මාර්ගයේ ආබාධිත පුද්ගලයෙක් සිටින බවත් , ත්‍රීවීල් රථයකටවත් මෙම මාර්ගයේ ගමන් කළ නොහැකි බවත් , නිවැසියන් ඉතා අපහසුවෙන් මෙම පුද්ගලයා රෝහලට ආදිය සඳහා ඔසවා ගෙන රැගෙන යන බවත් , ඔවුන් ඉතා අසරණ තත්වයට පත් වී ඇති බවත් , එනිසා මෙම මාර්ගය කඩිනමින් පිළිසකර කළ යුතු බවත් අදහස් දක්වමින් ගරු උපසභාපතිතුමා පවසා සිටින ලදී.

<u>තීරණ අංක 19</u>

ස්ථානය පරීක්ෂා කර බලා , ගිවිසුම්ගත කර වැඩ ඇරඹීමට ගොස් නැවතී තිබෙන රිල්හේන කනත්ත වත්ත මාර්ගය කඩිනමින් සැකසීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය පෙ.ව.10.15 ට මහා සභාවට පැමිණෙන ලදී.

**III.** <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමාගේ යෝජනා.</u>

**01.** ඉහළ හකමුව පදිංචි අඩු ආදායම්ලාභී වී.එම්.සෝමාවතී යන අයට වැසිකිලි ආධාර ලබා දීමට යෝජනා කරමි.

2022.02.10 දින මහා සභාවේ න්‍යායපත්‍රානුකූලව යථා පරිදි කල් දී ඇති යෝජනා ඉදිරිපත් කරන අවස්ථාවේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා සභාවට පැමිණ නොසිටි බැවින් එම යෝජනාව ඊළඟ සභාව සඳහා යථා පරිදි කල් දී ඇති යෝජනා ලෙස ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**IV.** <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බිමල්ක ප්‍රමෝදා මැතිතුමාගේ යෝජනා</u>

**01.** ඊරියන්දළුව ප්‍රධාන මාර්ගය පසුගිය වර්ෂාවට දැඩි ලෙස අබලන් වී ඇති බැවින් එයට තාර දමා සකස් කිරීමට යෝජනා කරමි.

2022.02.10 දින මහා සභාවේ න්‍යායපත්‍රානුකූලව යථා පරිදි කල් දී ඇති යෝජනා ඉදිරිපත් කරන අවස්ථාවේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බිමල්ක ප්‍රමෝදා මැතිතුමා සභාවට පැමිණ නොසිටි බැවින් එම යෝජනාව ඊළඟ සභාව සඳහා යථා පරිදි කල් දී ඇති යෝජනා ලෙස ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**V.** <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එල්.සුමිත් කුමාර මැතිතුමා.</u>

**01.** වල්බිහි වී ඇති පැල්වාඩිය ක්‍රීඩාංගනය දරුවන්ට ක්‍රීඩා කළ හැකි සේ බැකෝ යන්ත්‍රය යොදා සකස් කර දීම.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 20</u>**

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර, වල්බිහි වී ඇති පැල්වාඩිය ක්‍රීඩාංගනය දරුවන්ට ක්‍රීඩා කළ හැකි සේ බැකෝ යන්ත්‍රය යොදා සකස් කර දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** රජනා ඇල්ල ආශ්‍රිත ප්‍රදේශය සංචාරකයින්ට හිත සුව ස්ථානයක් බවට පත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එල්.සුමිත් කුමාර මැතිතුමා පවසා සිටියේ ප්‍රාදේශීය සභාවේ අනන්‍යතාව රැකෙන පරිදි ඇල්ලේ දර්ශනයක් සහිතව පුවරුවක් සවි කිරීම සුදුසු බවත් , කුටියක් සකස් කළ යුතු බවත් , ටෙන්ඩර් පටිපාටිය ඔස්සේ ගමේ පුද්ගලයෙකුට මෙම ස්ථානය ලබා දී සභාවට ආදායමක් ලබා ගැනීම සුදුසු බවත් ය.ප්‍රවේශ මාර්ගය සකස් කළ ද එම ස්ථානයට පැමිණෙන බොහෝ මිනිසුන් මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීම නිසා පවුලකට පැමිණ විනෝද වී යාමට නොහැකි බව පැවසූ එතුමා මෙම ඇල්ල ආරම්භ වන කබරගල රක්ෂිතයේ වෙනිවැල් , වල්ලපට්ට විශාල ලෙස මිනිසුන් විනාශ කරන බවත් , මේ සම්බන්ධව රක්වාන අඩවිවන කාර්යාලයේ නිලධාරින්ට දන්වා සිටියත් අවශ්‍ය කටයුතු සිදු නොවන බවත් , එනිසා ජනතාවට නිලධාරින් පිළිබඳව ඇති විශ්වාසය අඩු වී ඇති බවත් , මෙම ක්‍රියාව නතර කිරීම සඳහා යූ.අසිත ඉන්දික වීරවර්ධන මාධ්‍යවේදීයාගේ සහය ද ලබා ගත හැකි බවත් පවසන ලදී.

ඉතා වටිනා යෝජනාවක් බවත් , මත්ද්‍රව්‍ය පාවිච්චි නොකරන ලෙස දැන්වීම් පුවරුවක් සවි කර ජනයා දැනුවත් කිරීම සුදුසු බවත් , පොලිස් රථයක් නිරන්තරයෙන් යවා හෝ එම වැරදි ක්‍රියාවන් වැලැක්වීමට කටයුතු කිරීම සුදුසු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටින ලදී.

රජනා ඇල්ල ඉතා ප්‍රසිද්ධ ස්ථානයක් බවත් , එම ඉතිහාස කතාව ඇතුලත්ව පුවරුවක් සවි කර , කුටියක් සාදා , විනෝද වීමට හැකි ලෙස නමුත් සීමාවන් දමා සකස් කළ යුතු බවත් , මේවා අනාගත පරපුර වෙනුවෙන් රැක දිය යුතු බවත් , ප්‍රාදේශීය සභාවට ආදායමක් ලැබෙන සේ සුළු මුදලක් සංචාරකයින්ගෙන් අය කිරීම සුදුසු බවත් , මෙවැනි කටයුතු සඳහා සංචාරක අමාත්‍යාංශයෙන් මුදල් ප්‍රතිපාදන ලබා ගත හැකි බවත් , මේ ආකාරයට ම කිරිදි ඇල්ල , මරක්කල ඇල්ලත් සංවර්ධනය කළ යුතු බවත් ගරු උප සභාපතිතුමා පවසන ලදී.

විශාල සංවර්ධන කාර්යයන් සිදු කිරීමට සේවකයො විශාල ප්‍රමාණයක් අවශ්‍ය බැවින් එසේ කිරීමට අපහසු බවත් , ඇල්ලට යන පඩි පෙල ආදිය සංවර්ධනය කර ඇති බැවින් කුටියක් සාදා ඊළඟ වර්ෂය වන විට සංවර්ධන කටයුතු අවසන් කර , ටෙන්ඩර් පටිපාටිය ඔස්සේ ලබා දීමට කටයුතු කළහොත් ගමේ පුද්ගලයෙක් එය ලබා ගනී යන්නත් , කිරිදි ඇල්ලටත් වඩා රජනා ඇල්ල මාර්ගය ආසන්නයේ ඇති බැවින් විශාල මිනිසුන් ප්‍රමාණයක් පැමිණෙන බවත් , සභාවට ආදායමක් ලබා ගත හැකි ස්ථානයක් බවත් මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටින ලදී.

**<u>තීරණ අංක 21</u>**

රජනා ඇල්ල ආශ්‍රිත ප්‍රදේශය සංචාරකයින්ට හිත සුව ස්ථානයක් බවට පත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** මාවුදැල්ල , බුළුගහතැන්න ප්‍රධාන මාර්ගයේ සිට පහල නිවාස වලට පිවිසීම සඳහා පඩිපෙල සකස් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 22</u>**

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර , මාවුදැල්ල , බුළුගහතැන්න ප්‍රධාන මාර්ගයේ සිට පහල නිවාස වලට පිවිසීම සඳහා පඩිපෙල සකස් කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**හදිසි යෝජනා**</u>

<u>**ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ හදිසි යෝජනා.**</u>

**01.** 2021 වර්ෂයේ සභා අරමුදල් යටතේ ක්‍රියාත්මක කරන ලද හල්පාවල අතපත්තුව අළුබෝගහහේන හරහා ඉහලගේවත්ත පාර සංවර්ධනය කිරීම නැමති ව්‍යාපෘතිය රු.310,000.00 ක මුළු ඇස්තමේන්තුවක් සහිත ව්‍යාපෘතියකි.එහි වැඩ වියදම රු.280,000.00 කි. ගිවිසුම් ගත වීමේ දී අතපසුවීමකින් වැඩ වියදම වෙනුවට මුළු ඇඅස්තමේන්තු මුදලටම ගිවිසුම්ගත වී ඇත.කාර්මික නිලධාරින් සහතික කරන ලද බිල්පත් වටිනාකම රු.312,620.65 ක් වී ඇති අතර ඉන් ගිවිසුම් ගත මුදලට මෙම ව්‍යාපෘතියෙහි අවසන් ගෙවීම සිදු කර ඇත.ඒ අනුව 10% ක රඳවුම් මුදල වන රු.31,000.00 ක මුදල සභා අරමුදලේ තැන්පත් කර ඉතිරි මුදල වන රු.279,000.00 ක මුදල කොන්ත්‍රාත්කරුට ගෙවා ඇත.මෙම ගෙවීම සිදු කරන අවස්ථාවේ දී වැඩ වටිනාකමට අදාල මුදල ඉක්මවා සිදු කර ඇති වැඩ කොටස් ප්‍රමාණය සඳහා සහා අරමුදලින් ගෙවීමට මහ සභා අනුමැතිය ලබා ගැනීමටත් , කොන්ත්‍රාත් සමිතිය වන සභාපති , පුබුදු අවමංගල්‍යාධාර හා සුහ සාධන සමිතිය , හල්පාවල මහින් සභා අරමුදලේ තැන්පත් කර ගත් 10% ක රඳවුම් මුදල ඉල්ලා සිටින අතර එම රු.31,000.00 ක මුදල කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමටත් අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 23**</u>

2021 වර්ෂයේ සභා අරමුදල් යටතේ ක්‍රියාත්මක කරන ලද හල්පාවල අතපත්තුව අළුබෝගහහේන හරහා ඉහළගේවත්ත පාර සංවර්ධනය කිරීම නැමති ව්‍යාපෘතිය රු.310,000.00 ක මුළු ඇස්තමේන්තුවක් සහිත ව්‍යාපෘතියක් බැවින් ද , එහි වැඩ වියදම රු.280,000.00 ක් වී ඇති බැවින් ද , ගිවිසුම් ගත වීමේ දී අතපසුවීමකින් වැඩ වියදම වෙනුවට මුළු ඇඅස්තමේන්තු මුදලටම ගිවිසුම්ගත වී ඇති බැවින් ද , කාර්මික නිලධාරින් සහතික කරන ලද බිල්පත් වටිනාකම රු.312,620.65 ක් වී ඇති බැවින් හා ඉන් ගිවිසුම් ගත මුදලට මෙම ව්‍යාපෘතියෙහි අවසන් ගෙවීම සිදු කර ඇති බැවින් , 10% ක රඳවුම් මුදල වන රු.31,000.00 ක මුදල සභා අරමුදලේ තැන්පත් කර ඉතිරි මුදල වන රු.279,000.00 ක මුදල කොන්ත්‍රාත්කරුට ගෙවා ඇති නිසා ඒ අනුව කොන්ත්‍රාත් සමිතිය කහවත්ත , පනාවැන්න , හල්පාවල පුබුදු අවමංගල්‍යාධාර හා සුහ සාධන සමිතිය මඟින් සභා අරමුදලේ තැන්පත් කර ගත් 10% ක රඳවුම් මුදල ඉල්ලා සිටීම හේතුවෙන් හා තව දුරටත් 10% ක රඳවුම් මුදල රඳවා තබා ගැනීම කොන්ත්‍රාත්කරු වෙත සිදු කරන අසාධාරණයක් බැවින් කාර්මික නිලධාරී විසින් සහතික කර ලබා දෙන ලද එම බිල්පත් වටිනාකම අනුව සැබෑ ලෙසටම මෙම ව්‍යාපෘතිය සිදු කර ඇති බව මිනුම් වාර්තා පරීක්ෂා කිරීමේ දී පැහැදිලි වීම නිසා 10% ක රඳවුම් මුදල වන රු.31,000.00 ක මුදල කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩී.උපාලි මැතිතුමාගේ හදිසි යෝජනා.**</u>

**01.** පැල්මඩුල්ල , රිල්හේන වැඩිහිටි ජ්‍යොෂ්ඨ පුරවැසි සංවිධානය මානසික සුවය වෙනුවෙන් මාර්තු මස විනෝද චාරිකාවක් යාමට කටයුතු සූදානම් කර ඇති බැවින් එම සංවිධානය සඳහා විරිදු රබානක් , ඩොල්කියක් , බටනලාවක් ආදී සංගීත භාණ්ඩ කිහිපයක් ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙය යොජනාව මාර්තු මස මහා සභාවට කල් දී ඇති යෝජනා සඳහා ඇතුලත් කර අනුමත කර ගැනීමට තරම් කාලය ප්‍රමාණවත් නොවන බවත් , එනිසා හදිසි යෝජනාවක් ලෙස ඉදිරිපත් කළ බවත් ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින් පවසන ලදී.

ඒ සම්බන්ධව අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මේ සඳහා අවශ්‍ය වන බව ය.

<u>**තීරණ අංක 24**</u>

පැල්මඩුල්ල , රිල්හේන වැඩිහිටි ජ්‍යොෂ්ඨ පුරවැසි සංවිධානය මානසික සුවය වෙනුවෙන් මාර්තු මස විනෝද චාරිකාවක් යාමට කටයුතු සූදානම් කර ඇති බැවින් එම සංවිධානය සඳහා විරිදු රබානක් , ඩොල්කියක් , බටනලාවක් ආදී සංගීත භාණ්ඩ කිහිපයක් ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.ආරියරත්න මැතිතුමාගේ හදිසි යෝජනා.</u>

**01.** මාරපන වසමේ පනගම අලුතෙන් ඉදි කරන ලද පාලමට යන පිවිසුම් මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 25**</u>

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර , මාරපන වසමේ පනගම අලුතෙන් ඉදි කරන ලද පාලමට යන පිවිසුම් මාර්ගය කොන්ක්‍රීට් කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමාගේ හදිසි යෝජනා.</u>

**01.** මාරපන - හකමුව ප්‍රදේශ පසු කර රත්නපුර වෙත යන පිවිසුම් මාර්ගයේ දෙපස වල් බිහි වී ඇති නිසා එළිපෙහෙළි කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.ආරියරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මාරපන කලාපය ගත් විට මාරපන ශ්‍රාස්ත්‍රොදය පන්සලින් ආරම්භ වී මාරපන - හකමුව ප්‍රදේශ පසු කර රත්නපුර වෙත යන පිවිසුම් මාර්ගය ප්‍රධාන මාර්ගයෙහි අවහිරතාවයක් ඇති වුවහොත් ගමන් කිරීමට ඇති එකම මාර්ගය බවත් , නමුත් වල් බිහි වී ඇති නිසා එළිපෙහෙළි කරන ලෙස විශාල පිරිසක් ඉල්ලා සිටින බවත් අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා පවසා සිටින ලදී.

මෙම යෝජනාව ඉතා වැදගත් බවත් , පාර දෙපස තණකොළ ඉතා වේගෙන් වැවෙන බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.ආරියරත්න මැතිතුමා පවසන ලදී.

මෙම මාර්ගය පළාත් සභා ප්‍රධාන මාර්ගයක් බවත් , රත්නපුර විධායක ඉන්ජිනේරුට ගැසට් කර ඇති බැවින් ඔවුන් මෙම මාර්ගය නඩත්තු කළ යුතු බවත් , නඩත්තු කටයුතු වෙනුවෙන් එම කාර්යාලයට විශාල මුදලක් වෙන් කරන බවත් , මෙම කරුණු ඇතුලත් කර සභාවේ හදිසි යෝජනාවක් ලෙස විධායක ඉන්ජිනේරු වෙත මේ සම්බන්ධව ලිපියක් යොමු කිරීම සුදුසු බවත් මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටින ලදී.

<u>**තීරණ අංක 26**</u>

මාරපන - හකමුව ප්‍රදේශ පසු කර රත්නපුර වෙත යන පිවිසුම් මාර්ගයේ දෙපස වල් බිහි වී ඇති කොටස් එළිපෙහෙළි කරන ලෙස රත්නපුර විධායක ඉන්ජිනේරු කාර්යාලය වෙත ලිපියක් යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**02.** මාරපන ඉහළ හකමුව ක්‍රීඩා පිටිය කපා ගැනීම සඳහා බැකෝ යන්ත්‍රය ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.ආරියරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙවරත් අවුරුදු උත්සවයක් පැවැත්වීමට ඉහළ හකමුව තරුණ තරුණියන් සූදානම් වන බවත් , ඔවුන් ක්‍රීඩා පිටියේ අවශ්‍ය කටයුතු සඳහා බැකෝ යන්ත්‍රය ලබා දෙන ලෙස ඉල්ලීමක් කරන ලෙස ඉල්ලා සිටි බවත් , හැකි නම් බැකෝ යන්ත්‍රය ලබා දෙන ලෙසත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා පවසා සිටින ලදී.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙම යෝජනාව සම්බන්ධව කාර්මික නිලධාරී වාර්තාවක් ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බව ය.

<u>**තීරණ අංක 27**</u>

ස්ථානය පරීක්ෂා කර බලා කාර්මික නිලධාරී වාර්තාවක් ලබා ගෙන මාරපන ඉහළ හකමුව ක්‍රීඩා පිටිය කපා ගැනීම සඳහා බැකෝ යන්ත්‍රය ලබා දීම සුදුසු බවට ඒකමතකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බිමල්ක ප්‍රමෝදා මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.පියසේන මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි රිද්මා අනුරුද්ධිකා ධර්මවර්ධන මැතිතුමිය පෙ .ව.10.30 මහ සභාවට පැමිණෙන ලදී.

**06.කාරක වාර්තා සලකා බැලීම - 2022-01-13 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව අනුමත කිරීම.**

2022-01-13 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.හිරන්ති චතුරංගනී ගමගේ මැතිතුමිය විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**07. 2022-01-01 සිට 2022-01-31 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගිති වාර්තාව සලකා බැලීම.**

2022-01-01 සිට 2022-01-31 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගිති වාර්තාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.වී.අජිත් නිශාන්ත මැතිතුමන් විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.එම්.හේමන්ත පෙරේරා මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**08. වෙනත් කරුණු.**

- **සභාව දැනුවත් කිරීමේ නිවේදන හා අදහස් දැක්වීම.**

<u>ගරු උප සභාපති ඩී.වී.උපාලි මැතිතුමා.</u>

මෙම වර්ෂයේ අප්‍රේල් මස තමන් විදේශ ගත වීමට බලාපොරොත්තු වන බවත් , සවිස්තරාත්මකව ඉල්ලීමේ ලිපිය මහා සභාවට යොමු කරන තුරු නිවාඩු අනුමත කිරීමේ ලිපියක් නිකුත් කරන ලෙසත් ගරු උප සභාපති ඩී.වී.උපාලි මැතිතුමා ඉල්ලා සිටින ලදී.

- **පසුගිය සභාවේ ලබා ගත් තීරණ සම්බන්ධයෙන් ප්‍රගිතිය සාකච්ඡා කිරීම.**
- **නිවාඩු අනුමත කිරීම.**

අසනීප තත්ත්වයෙන් හේතුවෙන් සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ඇති ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජී.අනෝමා ප්‍රියදර්ශනී ගාල්ලගේ මැතිතුමියහට නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමන් විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.පුෂ්පලතා වැලිකල මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

- **මීළඟ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම.**

මහා සභාව 2022 මාර්තු 10 වන දින පැවැත්වීමට තීරණය විය.

- **සභාපතිතුමාගේ ස්තූති කතාව.**

අද දින සභාවට පැමිණ සිටින ගරු උප සභාපති තුමන්, විපක්ෂ නායක තුමන් ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාට හා මන්ත්‍රී තුමියන්ලාටත්, ජනමාධ්‍යවේදී මහතුන්ට ද, ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියළු දෙනාටත් ස්තූතිය පුද කරමින් සිය ස්තූති කථාව අවසන් කරන ලදී.

**පෙ.ව. 10.55 ට පමණ සභාවේ කටයුතු අවසන් විය.**

වාර්තා ගත කළේ

2022-02-25 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

ලේකම්
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

ප්‍රාදේශීය සභා ............................................................... මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා ............................................................... මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

2022-03-10 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව